# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2470/16 - 2026 ජනවාරි මස 05 වැනි සඳුදා - 2026.01.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

1987 වසරේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර ආචාර්ය ජයන්ත ලාල් රත්නසේකර වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය හා 171 (ආ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනත යටතේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව සඳහා මූල්‍ය පරිපාලනය සහ ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් පහත දක්වා ඇති නීතිමය විධිවිධාන ක්‍රියාත්මක කිරීමට මෙයින් බලය පවරමි.

ආචාර්ය **ජයන්ත ලාල් රත්නසේකර,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2026 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
ඔර්ස්හිල්,
ත්‍රිකුණාමලය.

**නියෝගය**

නැගෙනහිර පළාතට අයත් අම්පාර දිස්ත්‍රික් සීමාව තුළ පිහිටි නින්දවූර් ප්‍රාදේශීය සභාවේ සභාපති තනතුර පුරප්පාඩු වීම හේතුවෙන්, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66(උ) වගන්තිය ප්‍රකාරව නව සභාපතිවරයෙකු තෝරා පත් කළ යුතුය. නමුත්, නින්දවූර් ප්‍රාදේශීය සභාව සඳහා නව

සභාපතිවරයෙකු තෝරාපත් කර ගැනීම සඳහා පවත්වන ලද රැස්වීමේදී සභාවේ ගණපූරණය නොමැති වීම නිසා 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 (ඇ) වගන්තියේ 3 වන උප වගන්තිය ප්‍රකාරව නව සභාපතිවරයෙකු තෝරාපත් කර ගැනීමට නොහැකි විය. එබැවින්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ සභාපති තනතුර පුරප්පාඩු වීම හේතුවෙන්, 2026 වර්ෂයට අදාළ අයවැය වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඒ අනුව, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට අදාළ අත්‍යවශ්‍ය කටයුතු සිදු කිරීමට නොහැකිවී ඇත. එබැවින් , නින්දවූර් ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති සභාපති තනතුර සඳහා පත් කිරීම් සිදු කරන තෙක් හෝ නැතහොත් පනතේ සඳහන් වෙනත් විධි විධානයක් ක්‍රියාත්මක කරන තෙක්, අම්පාර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් සිදු කිරීමට මම මෙයින් බලය පවරමි.

**උපලේඛනය :**

01. පුනරාවර්ථන වියදම්

02. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන සහ පළාත් සභාවේ අනුමැතිය ලත් වෙනත් ව්‍යාපෘති

EOG 01 - 0050

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.